# ළමා අපචාර පිළිබඳව කරනු ලබන සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
22 FEB 2013
UNIVERSITY OF KELANIYA

විභාග අංකය : FGS/S/2001/138/R

කැළණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති (MSSC) උපාධි පරීක්ෂණයේ
අවශ්‍යතාවයක් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන
ස්වාධීන නිබන්ධනයකි.


| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 810 |
| වර්ග අංකය: | |


2009 මැයි මස
සමාජ විද්‍යා අධ්‍යයන අංශය,
කැළණිය විශ්වවිද්‍යාලය,
ශ්‍රී ලංකාව.

# සාරාංශය

මෙම නිබන්ධනය තුළින් මා මූලික වශයෙන්ම උත්සාහ ගනු ලැබුවේ ළමයා වැරදිකරුවෙකු වන්නේ කෙසේද? යන්න පිළිබඳව කරුණු විමසා බැලීමටයි.

එහිදී බාල අපචාර පිළිබඳව මෙතෙක් ඉදිරිපත් වී ඇති විවිධ සම්ප්‍රදායි හා න්‍යායාත්මක කරුණු තුළින් ඉවත් වී ඒ පිළිබඳව නිදහස්ව හා ස්වාධීනව විවෘත මනසකින් යුතුව කරුණු සොයා බැලීම මූලික අරමුණ විය. එනම් මෙහිදී ළමා අපචාරීන් බිහිවීම කෙරෙහි හේතුවන සාධක ලෙස බොහෝ දෙනා දක්වනු ලබන සමාජ, ආර්ථික, ජීව විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක කරුණුවලින් මිදී ඊට අමතරව ළමයින් වැරදිකරුවන් වීම කෙරෙහි බලපානු ලබන වෙනත් සාධක තිබේදැයි සොයා බැලීමට උත්සුක වුණෙමි. නමුත් ළමුන් වැරදිකරුවන් වීමට බලපානවා යයි සම්ප්‍රදායි කතිකාවේ සහ න්‍යායාත්මක කතිකාවේ අඩංගු කරුණු සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමක් මෙහිදී සිදු නොවේ. එම සාකච්ජා මත යැපීමෙන් බොහෝ දුරට මිදී ස්වාධීන ලෙස සාකච්ජාව ගෙන යාමට උත්සාහ දැරුවෙමි. ඒ සඳහා වැරදිකරුවන් යයි සැලකෙන ළමයින් හා ඔවුන් වැරදිකරුවන් ලෙස තීරණය කෙරෙන සමාජ ක්‍රියාවලියට විවිධ අයුරින් සම්බන්ධ වන පිරිස් සමඟ සාකච්ජා කොට ලබාගත් කරුණු විශ්ලේෂණය කිරීමක් මෙහිදී සිදු කළෙමි.

බාල අපචාර සම්බන්ධව සලකා බැලීමේදී නැතිනම් ළමයා වැරදිකරුවෙකු වීම සම්බන්ධව සලකා බැලීමේදී සැලකිය යුතු පැති කීපයක් ඇති බව මෙම සාකච්ජාවේදී අවබෝධ විය. එනම් පළමුව, බන්ධනාගාරගත කරන හා පුනරුත්ථාපන ආයතනගත කරන ළමුන් ප්‍රමාණය වැඩි වූ පමණින් ලංකාවේ ළමා අපචාර ප්‍රමාණය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇතැයි කිව නොහැකිය.

දෙවනුව මෙසේ ඇතුළත් වන ළමයින් සියලු දෙනා සමාජ නීති උල්ලංඝනය කිරීම නිසාම ආයතනගත වී යයි අපට උපකල්පනය කළ නොහැකි වුවත් එසේ ලේබල් කිරීමක් සිදුවේ.

තුන්වෙනුව මේ සමඟම ළමයින් සමාජ ක්‍රමයෙන් බැහැර කරලීමක් සිදුවේ. එම බැහැර කිරීම තුළින් බලාපොරොත්තු වන්නේ කුමක්ද? ඒ බලාපොරොත්තු වන දේ ඒ අයුරින්ම ඉටු වනවාද නැතිනම් මෙහිදී සිදුවන්නේ කුමක්ද? එමෙන්ම ළමයින් වැරදිකරුවන් කිරීම කෙරෙහි බලපාන නිශ්චිත සාධක ගොන්නක් හඳුනාගත හැකිද? යන කාරණය පිළිබඳව යම්කිසි අවබෝධයක් මේ තුළින් ලබාගත හැකිවිය.

ළමුන් වැරදිකරුවන් වීම කෙරෙහි බලපා ඇතැයි සිතිය හැකි කරුණු කිහිපයක් මෙම අධ්‍යයනය තුළින් අනාවරණය කර ගත හැකි විය. පළමුව මෙතැන ඇති විශාලතම ප්‍රශ්නය වන්නේ ළමයා හදා ගැනීමට දෙමාපියන්ට ආර්ථික වත්කමක් නොමැතිවීම, නැතිනම් ළමයාට ප්‍රමාණවත් පරිදි ආදරය, රැකවරණය, ආරක්ෂාව ලබාදීමට දෙමාපියන්ට

නොහැකි වීම යන කරුණු පැහැදිලි විය. එසේ නොමැතිව ළමයා වැරදි යැයි සැලකෙන ක්‍රියාවක් කිරීම ම ළමයා වැරදිකරුවෙකු ලෙස හඳුනා ගැනීමට වඩා වැදගත් වී ඇති බවක් නොපෙනුණි. මේ කරුණ හොඳින්ම පැහැදිලි වන අවස්ථා කිහිපයක් මෙම අධ්‍යයනය තුළින් සොයාගත හැකි විය. විශේෂයෙන්ම වරද ඔප්පු නොවූ පසුත් දෙමාපියන්ගේ කැමැත්ත මත ආයතනගතව සිටින නුවන් අසංක වැනි ළමුන් තවත් සිටිය හැක. අනෙක් අතට ළමයා ආයතනගත කරන්නේ ළමයා වරදක් කර ඇත්ද නැත්ද යන්න ගැන හරිහැටි ඔප්පු වීමට පෙර වරද කළා යැයි පවත්නා සැකය මත පමණක් බව ද ඇතැම් අවස්ථාවල පෙනුණි. මෙය ළමුන් කිහිප දෙනෙකු ආශ්‍රයෙන්ම දක්නට ලැබුණ කරුණකි.

එමෙන්ම මෙම අධ්‍යයනය තුළින් පෙනී ගිය තවත් කරුණක් වූයේ ළමුන් පිළිබඳව සමාජය තුළ පවත්නා සාවද්‍ය ආකල්ප ළමුන් වැරදිකරුවන් කිරීම හා ඔවුන්ට දඬුවම් කිරීමට බොහෝදුරට ඉවහල් වී ඇති බවයි. ළමයා ගැන සමාජ වාර්තා සැකසීමේ ක්‍රියාවලියේ සිට ළමයා ආයතනගත කෙරෙන තුරු සිදුවන සෑම ක්‍රියාවලියක් තුළම කෙසේ හෝ ළමයා වරදකරුවෙකු ලෙස හඳුනා ගැනීමට කරුණු ගොනු කිරීමක් මිසක් ළමයාගේ අතින් ගත් විට සාධාරණ කරුණු විමසීමක් සිදු නොකරන බව පැහැදිලි විය. එය විශේෂයෙන්ම ළමයා පිළිබඳව ඒක පාර්ශ්වීය විනිශ්චයන්වලට එළඹීමට බොහෝ විට උත්සාහ දරා ඇති බව පෙනේ.

සාමාන්‍යයෙන් පරිවාස නිලධාරීන් ඉදිරිපත් කරනු ලබන සමාජ වාර්තාව ළමයාගේ පැත්තෙන් කරුණු සොයා බලා ඉදිරිපත් කරන්නක් ලෙස පොදුවේ සැලකුවද එය එසේම සිදු නොවන බව ද මෙහිදී පෙනී ගිය කරුණකි. පරිවාස නිලධාරී ළමා අපචාර ගැන ඉදිරිපත් වී ඇති විවිධ සමාජ න්‍යායයන් ඔස්සේ කරුණු ගොනු කිරීමට උත්සාහ කරනු පෙනේ. එනම් බොහෝ විට අපචාර පහළ පන්තියේ සමාජ චර්යාවක්ය යන කරුණ මෙහිදී වඩා ඉවහල් කරගෙන ඇත. නමුත් මේවා ප්‍රකාශනයන් පමණි. අදහස් අප ළමයින් සම්බන්ධයෙන් යොදා ගැනීමේදී ඉතා වගකීමකින් යුක්තව කටයුතු කළ යුත්තේ ඒ නිසාය. ළමා අපචාරී චර්යාව පහළ පන්තියේ සමාජ චර්යාවක්ය යන පොදු සමාජ අදහස ලමුන් වරදකරුවන් ලෙස හඳුනා ගැනීමේදී එම හඳුනා ගැනීමේ පදනම සාධාරණීකරණය සඳහා යොදා ගෙන ඇත. මේ නිසා අපචාර පහළ පාන්තික සමාජ චර්යාවක්ය යන සාම්ප්‍රදායික කතිකාව වැරදි නොකරන ලද ළමුන් පවා වැරදිකරුවන් ලෙස ලේබල් කිරීමට ඉවහල් වී ඇත. එය ළමයාගේ අනාගත පැවැත්මට කොතරම් හානිදායක වනවාද යන්න අමුතුවෙන් කිව යුතු නොවේ.

විශේෂයෙන් මා නිරීක්ෂණය කරන ලද සමාජ වාර්තා එකක් හැර සියල්ලගෙන්ම පෙනී ගිය ප්‍රබල කරුණක් වූයේ මෙයයි. සොරකමට හෝ වෙන යම් ක්‍රියාවකට යොමු වූවා යැයි සැලකෙන ළමයෙකු ගැන සොයා බැලීමට පරිවාස නිලධාරීන්ට උසාවිය නියම කළ විට ඔහු වහාම සොයා බලන්නේ ළමයාගේ සමාජ තත්ත්වය හා පවුල් ව්‍යුහය වැනි කරුණුය.

මෙහිදී පෙනීගිය තවත් කාරණයක් වූයේ ළමයා සුළු වරදක් කළ පමණින් ඔහු හදාගත නොහැකිය, අනාගතයේ ඊට වඩා දරුණු අයෙකු විය හැකිය, යන ආකල්පය මත පිහිටා ඔවුන්ව ආයතන ගත කිරීමයි. එහිදී දෙමාපියන් සිතන්නේ ළමයා යහපත් මාර්ගයේ යෙදවිය හැකි පහසුම ක්‍රමය ආයතන ගත කිරීම බවයි. මෙය ඇතැම් දෙමාපියන් වගකීම් වලින් ගැලවීමේ මගක්ද කරගෙන ඇති බවක් පෙනුනි. නමුත් ළමයා ආයතන ගත කළ පමණින් ඔහු යහපත් යැයි සැළකෙන පුද්ගලයෙකු බවට පත් වේයයි, නිශ්චිතවම කිව නොහැක. එසේම ළමා උසාවියක් තුළ නඩු විමසීම මගින් ළමයා මුහුණපාන ඇතැම් දුෂ්කරතා වලින් ඔහු මුදවාලිය හැකිය. මේ නිසා මේ සම්බන්ධව කටයුතු කරන නිලධාරී පැලැන්තියට තම කාර්ය භාරයේ වගකීම් සහගත බව හා වැදගත් බව ගැන කරුණු අවබෝධ කර දීම වැදගත්ය.

ළමුන් වරදකරුවන් වීම කෙරෙහි බලපාන නොයෙකුත් හේතු මෙහිදී විමසා බැලුවෙමි. එම සාධක නොයෙක් අයුරින් සංකීර්ණ ලෙස එක්ව ජාල ගතව ළමයා කෙරෙහි බලපාන බව දක්නට ලැබුණි. මෙම හේතු එක් අයෙන් අපචාරියෙකු ලෙස හඳුනා ගැනීමටත් තවත් අයෙක් එයින් ඉවත් කිරීමටත් බලපාන බව එයින් පෙණුනි. එසේම බාල අපචාර පිළිබඳව නොයෙකුත් න්‍යායන් ඉදිරිපත් වී ඇතත්, අප ඒවා අවබෝධ කරගත යුත්තේ තාර්කික බුද්ධියෙන් විමසා බැලීමෙන් පසුව බව මෙහිදී අවබෝධ විය . ප්‍රශ්නය විෂයානුබද්ධව අවබෝධ කර ගැනීම මුළු මහත් සමාජයටම ප්‍රයෝජනවත් වන බවද අවධාරනය කෙරිණ. එය ළමුන් සම්බන්ධයෙන් සලකා බලන විට වැදගත් හා අගනා ක්‍රියාවකි .

අපචාරීන් යයි සලකනු ලැබූ නමුත් එසේ නොවන ප්‍රමාණවත් ආරක්‍ෂාව, ආදරය, රැකවරනය අවශ්‍ය නමුත් එසේ නොලබන ළමුන් පිළිබඳවද සඳහන් කළෙමි. ඔවුන් බොහෝ දෙනෙකු අපචාරීන් වී ඇත්තේ හුදෙක් දෙමාපියන් හා සමාජය තුළ ඔවුන් පිළිබඳ පවත්නා අනවබෝධය හා සාවද්‍ය ආකල්ප නිසාම බව මෙහිදී පැහැදිලි විය. ඊට අමතරව මෙය පහළ පංතියේ සමාජ චර්යාවක්ය, අන්තර් ආශ්‍රය නිසා ඇතිවන්නක්ය, ආදී වශයෙන් මේ ගැන පළවන හා මෙතෙක් පළවී ඇති න්‍යායාත්මක කරුණුද මීට ඉවහල් වී ඇති බව පෙණුනි.

ළමයාගේ උරුමය ඇත්තේ සමාජයේය. ඔවුන් අපගේ අනාගත පරම්පරාවයි. මේ නිසා ඔවුන්ගේ ජීවිත ඔවුන් බලාපොරොත්තු වන ආකාරයට යහපත්ව පවත්වාගෙන යාමට උදව්කිරීම අපගේ වගකීම වේ. එසේ නොමැතිව මේ ළමයා මාගේය, මේ ළමයා පිටස්තරය, ආදී වශයෙන් වෙනස්කමක් දැකීමට වැඩිහිටියන් වශයෙන් අපට යුතු කමක් නැත. ඒ අනුව බලන විට බාල අපචාරීන් පිළිබඳ ප්‍රශ්නය විශාල ගැටළුවක් වශයෙන් ගොඩනැගී ඇත්තේ අප තුළම ක්‍රියාත්මක වෙමින් පවත්නා ඇතැම් වැරදි ක්‍රියාමාර්ගවල අතුරු ඵලයක් නිසාම බව පෙනේ. මේනිසා එම තත්වයන් හඳුනා ගැනීමෙන් තොරව මෙම ගැටළුවට විසඳුමක් සෙවීම අපහසු බව අවසාන වශයෙන් කිව යුතුය.